සබරගමුවපළාත්අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**පළමු වාර පරීක්ෂණය 2018** **06 ශ්‍රේණිය**
**மூன்றாம் தவணைப் பரீட்சை 2018** **தரம் 06**
**FirstTerm Test 2018** **Grade 06**

**බුද්ධ ධර්මය I,II** ***කාලය පැය දෙකයි.***

නම ..........................................................................................................

පළමු කොටස සඳහා පිළිතුරු මෙම පත්‍රය තුළම සපයන්න.

- 1-10 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුරට අදාළ අංකය හිස්තැන් මත ලියන්න.

1. සිදුහත් බෝසතුන් මව් කුස පිළිසිඳ ගත්තේ,
   1.වෙසක් පොහෝ දිනකය.
   2.පොසොන් පොහෝ දිනකය.
   3.ඇසළ පොහෝ දිනකය.
   (.............)

2. බෝසත් කුමරුට නම් තැබීම සිදුකළේ ඉපදී දින
   1. 3 කට පසුවය.
   2. 5 කට පසුවය.
   3. 7 කට පසුවය.
   (.............)

3. සත්ත්වයන්ගේ උප්පත්තිය හා මරණය සිදුවන ආකාරය දැකීමේ නුවණ,
   1.පුබ්බේ නිවාසානුස්සති ඤාණයයි.
   2.චුතූපපාත ඤාණයයි.
   3.ආසවක්ඛය ඤාණයයි. (.............)

4. සිදුහත් බෝසතුන්ට සිවුරු පිරිකර පිළිගැන්වූයේ කව්ද?
   1.සහම්පතී මහා බ්‍රහ්මයා
   2.ඝටීකාර බමුණා
   3.ඡන්න ඇමති (.............)

5. පාරිභෝගික චෛත්‍ය යනු,
   1.වෙහෙර වහන්සේ ය.
   2.බොධීන් වහන්සේ ය.
   3.පිළිම වහන්සේ ය. (.............)

- 6-10 දක්වා ප්‍රකාශවලට හරිනම් ( √ ) ලකුණ ද වැරදි නම් ( X ) ලකුණ ද යොදන්න.

6. පිය රජුගේ දෙවන වැඳුම ලබන විට සිදුහත් කුමරුට වයස මාස 05 කි. (.............)
7. ලුම්බිණි සල් උයන පිහිටියේ කිඹුල්වත්නුවර හා දෙව්දහ නුවර අතරය. (.............)

8. පන්සල් වෙත යන ඔබ පළමුව වන්දනා කළ යුත්තේ,බෝධීන් වහන්සේටය. (.............)

9. දියුණුවේ දොරටු අතර "ධම්මානුවත්තී" යනු දැහැමිව ජීවත් වීමයි. (.............)

10.සිදුහත් කුමරු ගිහිගෙය හැර ගියේ,වෙසක් පොහෝ දිනකය. (.............)

- අංක 11- 15 තෙක් ප්‍රකාශවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.

( සහම්පතී මහා බ්‍රහ්මයා/අසිත/108/ශික්ෂාකාමී/කොණ්ඩඤ්ඤ)

11.සුද්ධෝදන රජුගේ ගුරුවරයා ...........................තාපසතුමා ය.

12.එක ඇඟිල්ලක් ඔසවා සිදුහත් කුමරු බුදුවන බව ප්‍රකාශ කළේ ...........................බමුණාය.

13.බෝසතුන්ට මනුලොව උපදින්නට ආරාධනා කළේ,............................ය.

14. සිදුහත් කුමරුගේ නම් තැබීමේ උළෙලට බමුණන් ...........................ක් සහභාගී විය.

15. බුදුරජාණන් වහන්සේ රාහුල හාමුදුරුවන්ට .......................... භික්ෂූන් අතර අග තනතුර පිරිනැමූ සේක.

- ගැළපෙන පිළිතුර තෝරා යා කරන්න

| | |
|---|---|
| 16. සිදුහත් කුමරු මව්කුස පිළිසිඳ ගැනීම සිදු වූයේ, | A ශාරීරික,පාරිභෝගික,උද්දේසික වේ. |
| 17. ත්‍රිවිධරත්නය නම්, | B තව්තිසා දෙව්ලොවය. |
| 18. නිබ්බුත පද කීවේ, | C ඇසළ පොහෝ දිනකය. |
| 19. ත්‍රිවිධ චෛත්‍ය නම්, | D කිසාගෝතමිය යි. |
| 20. බෝසතාණන්වහන්සේගේ අවසන් භවය සිදු වූයේ, | E බුද්ධ,ධම්ම,සංඝ යි. |

## II කොටස

කෙටි පිළිතුරු සපයන්න.

1. (I) පංච මහා විලෝකනය නම් කරන්න.
(II) වප් මගුල් දින සිදුහත් කුමරු වැඩූ භාවනාව කුමක් ද?
(III) සුද්ධෝදන රජු සිදුහත් කුමරුට සාදා දුන් මාලිගා තුන මොනවාද?
(IV) සිදුහත් කුමරු උපදින අවස්ථාවේ සිදුවූ විශේෂ සිදුවීම් දෙකක් ලියන්න.
(V) බුද්ධ කෝලාහලය යනු කුමක්ද?
(VI) සිදුහත් කුමරුගේ ගුරුවරයා නම් කරන්න
(VII) පස්වග මහණුන් නම් කරන්න.
(VIII) සතර පෙර නිමිති මොනවාද?
(IX) සිදුහත් බෝසතුන්ට කුස තණ අට මිටක් පූජා කළේ කවුරුන් ද ?
(X) සත්‍ය සොයා යාමේදී සිදුහත් බෝසතුන්ට හමු වූ ගුරුවරු දෙදෙනෙක් නම් කරන්න.

( ල.2x10 = 20)

2. (I) "වන්දාමි චේතියං සබ්බං"යන ගාථාව සම්පූර්ණ කරන්න.( ල.02)
(II) පහත වචන වලට ශාසනික වචන ලියන්න.

1.වාඩිවෙනවා............................. 2.අතුගානවා.............................
3.නිදනවා............................. 4.වතුර.............................
5.කනවා............................. 6.යනවා.............................

( ල.03)

(III) විහාරස්ථානයට ගොස් ඔබ සිදුකරන වතාවත් පහක් ලියන්න.

( ල.05)

3. (I) මෛත්‍රිය යන්නෙහි අදහස කුමක් ද? ( ල.02)
(II) භාවනා කිරීමේදී පුද්ගලයෙකු හිඳ ගත යුතු ඉරියව් දෙක මොනවාද?

( ල.03)

(III) මෙත් වැඩීමේ ආනිශංස පහක් ලියන්න. ( ල.05)

4. (I) රාහුල හාමුදුරුවන් රහත් වූයේ කුමන සූත්‍රය ඇසීමෙන් ද? ( ල.02)
(II) රාහුල හාමුදුරුවන් තුළ පැවති ඉතා අගනා පුරුද්ද කෙටියෙන් ලියන්න. ( ල.03)
(III) රාහුල හිමිගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ පහක් ලියන්න. ( ල.05)

5. (I) දියුණුවේ රන් දොරටු ඉගැන්වෙන ජාතක කතාව කුමක් ද ? ( ල.02)
(II) එහි ඉගැන්වෙන කරුණු අතරින් තුනක් ලියන්න. ( ල.03)
(III) කම්මැලි නොවීම තුළින් ඔබට සැලසෙන ප්‍රයෝජන තුනක් ලියන්න. ( ල.05)